




**සිසිර දිසානායක**



යන්න එන්න යාන වාහන නැති කාලෙ තමන්ගේ වාහනේ පන්හිඳයි පින්සලයි දාගෙන ගිහින් කලා කටයුතු වලට සම්බන්ධ කැගන්න, ඒ ඒ අයට අඳුන්වලා දෙන්න ජගත් සහෝදරයාට තිබුණේ පුදුම උනන්දුවක්. ස්වාගේ අඳුනාගත්ත කලාකරුවන් අතරින් කෙනෙක් තමයි ෂ්‍යාමොන් ජයසිංහ

# මහාසාර පළඳනාව පැළඳගත්ත සිදංගනාවේ

මහත්මයා.

"අපි නම් ලංකාවෙදි අපෙන් කෙරෙන්න ඕනෙ හැම දෙයක්ම කරලයි ආවෙ.. ඔයාලට ඒ ගැන මොනවද කියන්න තියෙන්නෙ..?" ජයසිංහ මහත්මයා ඇහුවා.

"කොර වෙන ප්‍රශ්නයක් නේද උන්නැහේ ඇහුවෙ..?" පන් පින් ට හෙමිහිට මිමිනුවා.

තමන් යමක් කළාද කියලාවත් දැනං හිටියෙ නැති පින් ට මේ කතාව තුන් තේරවිල්ලක් වගේ වුණා. නිර්මාණ කරන මොනයම්ම කෙනෙකුට වුණත් තමන් උපරිමයකට කළා ය කියලා සෑහෙන්න අමාරුයි. ලංකාවෙදිත් මදි නොකියන්න කරපු අයට මේ රටට ඇවිල්ලත් නිකම් ඉන්න අමාරුයි. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර ශූරීන්ගේ අද්විතීය ප්‍රහසනය මෙල්බන් නුවර නිෂ්පාදනයක් විදිහට කළ එලි දැක්වුණේ ත් ජයසිංහ මහත්මයාගේ නිවෙසින් මයි. ඒ මාලිනී ජයසිංහ මැතිණිය අතින්.

"ඒක පුදුමයක් නෙවෙයි..- පින් කිව්වා.

"ඔව් ඉතින් සරච්චන්ද්‍ර මහත්තයාගේ මනමේ කතාවේ පොතේ ගුරා, සිහබාහු කතාවේ සිංහයා පදිංචි වෙලා ඉන්න සාවියෙන් ඔහොම දෙයක් නොවුණා නම් තමයි පුදුමෙ.."

"යමක් කරන්න හිතුණා ම ඒ දේ කරන්න තමන්ට පුළුවන් ය කියන ආත්ම විශ්වාසය තියෙන්න ඕනෙ.. මෙල්බන් නුවර ඉන්න සිංහල පිරිස අතර තියෙන හීනමානය දුරු කරන්නයි මට ඕනෙ වෙලා තිබුණෙ" මහාසාර ප්‍රදර්ශණයෙන් පසුව කණ්ඩායමේ හමුවීමකදී එහි අධ්‍යක්ෂ ප්‍රවීණ රංග ශිල්පී ජය ශ්‍රී චන්ද්‍රජිත් මහත්මය පැවසුවේලු. මෙම අසීරු අභ්‍යාසය තුළින් දිනූ එකම දෙයයි ඒ. ශාලාවේ සිය ගණනක් නෙත් කඳුලින් තෙත් වූයේ ත් දෙඅත් සිය ගණනක් පොලසන් දුන්නේත් ඔබ විසින් කැප කරන ලද කාලයටයි. ශ්‍රමයටයි. ඔබගේ උනන්දුවටයි. රංග ශිල්පී ශිල්පිණියනි, ගායක ගායිකාවනි, වාදක වාදිකාවනි. ඒ තුළින් ඉස්මතුවී නැගීයේ ඔබගේම කුසලතාවයි. දිනෙන් දින එය ඔපවත් කරගන්නට අවස්ථාව ලැබේවා යන්නයි අපේ ඒකායන ප්‍රාර්ථනය.. පන් ලිව්වා.

"ඇත්තටම හීනමානෙ තියෙන්නෙ නම් ඕවා කරන ඇත්තන්ට නෙවි. මුකුත්ම කර කියාගන්න බැරි උදවියට.." පින් කිව්වා.

මහාසාර උත්සාහය ගැන සිහිපත් කිරීමේදී පසුබිමෙහි සිටි පිරිසක් ගැන සටහනක් තැබිය යුතුම වේ. ඒ කැමරන් කොළඹගේ සංගීතවේදියා ප්‍රමුඛ තරංගා වාදක කන්ඩායමයි. දීර්ඝ කාලයක පටන් සිය ශ්‍රමය කාලය සහ ධනය වැය කරමින් රසික සවන සුමියුරු සෞම්‍ය ස්වර පෙළක දැහැන් ගන්වන්නට ඔබ දරනා ප්‍රයත්නය අපූරුයි. ප්‍රශංසනීයයි. ශිල්පි ශිල්පිණියනි, සංක්‍රමණික හෙළයන්ගේ දෙවන පරපුර වෙත හෙළ මියැසියේ රසහව් මැවීමට , විඳීමට රසඥතාව දායාද කරන ඔවුනට අපේ ආශිර්වාදය නිතැතින්ම හිමි විය යුතු නොවේද? වික්ටර් රත්නායක සංගීතවේදියාගේ ස ප්‍රසංගයේදී ශිල්ප දැක්වූ මෙල්බර්න් පුරවර යොවුන් මියැසි කැළ ඊට කදිම නිදසුනකි. හෙළ අකුරට ආගන්තුක වූ දරු දැරියන් සත් සර මහිමයෙන් හෙළ ආරට ඒකාත්මීය කලා වූ සංගීතවේදියාණන්ගේ ඉදිරි ගමනට අපේ සුබපැතුම්. පන් ට ලියලම හති. මේ වගේ දිගින් දිගට ලියන්ට පන්ට වැඩිය හුරු නෑ. ඔය සීපදයක් වගේ දෙයක් ගැට ගහලා පැත්තකට වෙලා ඉන්නයි පන්ගේ වැඩි කැමැත්ත.

"පහුගිය සන්නස නලාපයේ කතා බහේ ත් ඔය ගැන ලියැවිලා තිබුණා නේද?" පින් ඇහුවේ වැඩි සතුටකින් නෙවෙයි. "ආයෙ ආයෙ එකම දේ ලිව්වොත් කියවන අයට එපා වෙයි"

"ඇත්තටම කාලයක ඉඳලා ලියන්න උන්නු දෙයක්.. කතා බහේ ඌණ පූරණයක් හැටියට වත් ලියලා අගය කළ යුතු දේ අගය කරන්න ඕනෙ.." පන් තීන්ත කුප්පියට එබුණා.

"ඌණ පූරණයක් කිව්වේ..?" පින් දෙබැම නළලට ගත්තා.

"ඇයි දැක්කෙ නැද්ද සන්නසේම තිබුණා සිදංගනාවන් ගැන..? අපි නවත්තපු තැනින්ම පටන්ගමු.." පන් තීන්තෙන් පිරිලා තීන්ත අකුරු වලට හරවන කල් ඉවසිල්ලක් නැහැ.

මහාසාර වේදිකාව අබියස දැල්වුණා වූ මඳ ආලෝකයෙන් ස්වර ඛණ්ඩ අහුලාගනිමින් වස්දඬු හඬ නංවන පියකරු දැරියකි. ඇයගේ සුසුම නලවා මුදා හල සයැඟිලි පෙරදිග රටාවට හුරු වූ ඒවා නොවේ. ඇය තමාට අදාල ස්වර ඛණ්ඩය සොයා යන්නේ රිද්ම රටා ගණනය කිරීමෙනි. එයයි ආශ්චර්යය. හිමිදිරියේ කලබල ස්පෙන්සර් ස්ට්‍රීට් දුම්රියපළේ සෙනඟ අතරින් නිවැරදිව සිය එල්ලය සොයා යන අඳ දැරියක සිහිපත් වේ. තාක්ෂණයේ හා අදාල ශිල්පයේ පරිණත බව සියලු අන්ධකාරයන් අභිබවා යේ. මේ දැරිය වීණා කෑඳරගම නම් වූවා ය. ඇයට පෙරාතුවම තරංගා වාදක මන්ඩලයට එක්ව සිටින්නා වූ අනිත් දැරිය දිලිණි ප්‍රනාන්දු නම් වන්නී ය. සර පුවරුව අතැඹුලක් සේ ය ඇයට දැන්. ඒ අපරදිග හුරුවට පමණක්ම නොවේ. බහතෝරන වියේ දී මෙරටට සංක්‍රමණය වූ දෙමව්පියන් ඇයට දුන් දායාදයයි මේ. සවන රඳන දෑ දසැඟිලි තුඩින් මුදවාලන්නටය ඈ හපනියක වූයේ. ස්වර සටහන් නාද ගැන්වීම දෙවනුව ඇය උගත්තා ය.මව් බිමෙන් සපැමිණ විස්කම් පානා ගායන හා වාද්‍ය විශාරදයන් අතරේ නොදෙවෙනි වන්නට මෙම ලාබාල වාද්‍ය ශිල්පිණියන්ගෙ දෙදෙනා නංවා ලීමම මහඟු පුණ්‍යකර්මයකන් නොවේ ද?



අසුන්තා කරුණාරත්න හෙළ සංක්‍රමණිකයන්ගේ දෙවන පරපුරේ කැපී පෙනෙන ගායන ශිල්පිණියයි. තරංගා මියැසිය ලාලන ස්වරයෙන් ගී ගන්වන ඇය පෙර අපර දෙදිගම ඌරුවට දස්කම් පාන්නියකි. හෙළ ඌරුවට වචන උසුරුවීම අප දෙවන පරම්පරාවෙන් ගිළිහී යන මෙවන් පසුබිමෙක ඕ කෝමල හඬින් රසිකයා මව්බිමට කැන්දා ගෙන යන්නීය. -සිදංගනාවන්- ඇයගේ මුල්ම ගී එකතුවයි.

එකම පුෂ්ප මංජරියක කැකුළු තුනක් වන් එම දැරියන් තිදෙන පිළිබඳව මෙලෙස සටහන් වන්නේ අනෙකුත් දරු දැරියන්ටද එය පූර්වාදර්ශයක් වනු සඳහායි. මෙරට වසන අනෙකුත් ජාතීන් සිය අනන්‍යතා පරපුරෙන් පරපුරට දායාද කරමින් සිටිනා මෙවන් අවධියක එය අප සමාජ උපකුලකයේ ද කාලීන අවශ්‍යතාවක් බවට පත් වී ඇත. ඒ වෙනුවෙන් කැප වීමට පෙළ ගැසිය යුතුවන්නේ දෙමාපියන් නොවේද? දෙමව්පියන්ගේ ලෙයින් හා කිරෙන් පරපුරෙන් පරපුරට දායාද කල හැකි අගනාම දායාදයයි අපේ හර පද්ධතීන් තොනු කරගත් කුසලතාවන්. එම ක-ලතාවන් දරුවන් අතට ලැබෙන මහාසාර පළඳනාව වැනි වූ ආභරණයක් නොවන්නේ ද? එය වානරයන් අතට පත් විය යුතු නොවේ. කුලතාව ආරෝපනය කර ගැනීමට, මුදලට ගැනීමට හෝ පැහැරගැනීමට නෙහැකි දෙයක් බැවින් වානරයන් අත පත් වුවද ඉන් පළක් නොවේ.

"සිදංගනාවන්" යනු දිව්‍යාංගනාවන් වෙසෙසකි. ඔවුනගේ විශේෂත්වය නම් සංගීතයෙහි ඇති නිපුණත්වයයි. දෙමව්පියන්ගෙන් ලැබෙන කුසලතාව නමැති මහාසාර පළඳනාව පැළඳගන්න ඉතින් සිදංගනාවනි. ■


